72

අභ්‍යන්තර චක්‍රලේඛ අංක - 01/2019

අභ්‍යන්තර විගණන අංශය,
පළාත් සභා හා පළාත් පාලන අංශය.

2019.05.09

**සියළුම ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්/සම්බන්ධීකාරකවරුන්,**

**ව්‍යාපෘති සම්බන්ධ අභ්‍යන්තර විගණනය ක්‍රමානුකූල කිරීම**

මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව කිසියම් ව්‍යාපෘතියක එහි ව්‍යාපෘති අධ්‍යක්ෂක එම ව්‍යාපෘතියේ ගණන්දීමේ නිළධාරියා වේ. මු.රෙ.128(1) අනුව ගණන්දීමේ නිළධාරියෙකු විසින් ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා වෙත වගකිව යුතු කාරණා කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. මුදල් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ DMA/01-2019 මඟින් අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයක් නිකුත් කර ඇත.

- විගණන කළමනාකරණ කමිටු නිසි පරිදි කාර්තුවකට 01(එක) බැගින් වර්ෂයට වාර 04 (හතරක්) ක් පැවැත්වීම.
- විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ යුතු මූලික කරුණු තීරණය කිරීම
- අභ්‍යන්තර විගණන සැළැස්ම පිළියෙල කිරීම
- විගණන කළමනාකරණ කමිටුවේ සංයුතිය තීරණය කිරීම

ඇතුළුව යථෝක්ත චක්‍ර ලේඛණයේ උපදෙස් අභ්‍යන්තර විගණනය ක්‍රමානුකූල කිරීම සඳහා අනුගමනය කරන ලෙස දැනුම් දෙමි.

03. ව්‍යාපෘතිය වෙනුවෙන් අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇති විටකදී ඔහු ද එසේ නොවන විටකදී මෙම අමාත්‍යාංශයේ ව්‍යාපෘති හා සැළසුම් අංශයේ අභ්‍යන්තර විගණකද, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වල කැඳවුම්කරු ලෙස ක්‍රියා කළ යුතු වේ.

**එච්.ටී .කමල් පත්මසිරි,**
**ලේකම්,**
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු
සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.

පිටපත් 01.විගණකාධිපති , ජාතික විගණන කාර්යාලය - දැ.ගැ.ස
02.අධ්‍යක්ෂ , කළමනාකරන හා විගණන දෙපාර්තමේන්තුව- දැ.ගැ.ස
03.අතිරේක ලේකම් (ව්‍යාපෘති හා සැළසුම්) - අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රමානුකූල කර ගැනීම සඳහා අදාළ කර ගැනීමට
04.අභ්‍යන්තර විගණක, (ව්‍යාපෘති )පළාත් සභා හා පළාත් පාලන අංශය - අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රමානුකූල කර ගැනීම සඳහා අදාළ කර ගැනීමට